# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING



මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat, Colombo 01.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury. gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බීඩී/965/1/476 ඔබේ අංකය / உமது இல. / Your No.: දිනය / திகதி / Date: 2006. 12. 29

ජාතික අයවැය චක්‍රලේඛ අංක 133

ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

**<u>රාජ්‍ය වියදම් කළමනාකරණය සහ 2007 වර්ෂය සඳහා වියදම් දැරීම</u>**

අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද 2007 අයවැය කථාවේ සඳහන් රාජ්‍ය වියදම් හැසිරවීමේ යෝජනාවන් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු මැනවි.

**1. පුනරාවර්තන වැය විෂයන් සඳහා අර්ථාන්විතව වියදම් දැරීම.**

1.1 සැපයීම්, නඩත්තු සහ සේවා වියදම්

පුනරාවර්තන වියදම් පිළිබඳව මනා කළමනාකරණයක් ඇති කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවට අනුව සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් සඳහා 2007 මුද්‍රිත ඇස්තමේන්තුවල ඇතුලත් පහත සඳහන් වැය විෂයයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලින් 2% ක් අඩු කරනු ඇත.

| වැය විෂය සංකේතය | වැය විෂය කාණ්ඩය | වැය විෂය නාමය |
|---|---|---|
| 1202 | සැපයීම් | ඉන්ධන |
| 1205 | සැපයීම් | වෙනත් |
| 1301 | නඩත්තු වියදම් | වාහන |
| 1401 | සේවා | ප්‍රවාහන |
| 1402 | සේවා | තැපැල් හා සංනිවේදන |
| 1403 | සේවා | විදුලිය සහ ජලය |

ඉහත සඳහන් ගැලපීම භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් සඳහා ද අදාල වේ.

ඉහත සඳහන් වියදම් ඇතුළු සියලු පුනරාවර්තන වියදම් වෙනුවෙන් විධිමත් පාලන ක්‍රම යොදා ගැනීම මගින් සහ වඩාත් අරපිරිමැස්මෙන් යුතුව සමස්ත ප්‍රතිපාදන භාවිතා කිරීම තුලින් වියදම් කළමනාකරණය කර ගැනීමට සියළුම ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමු කළ යුතු වේ. යෝජිත වියදම් අඩු කිරීම

හේතු කොට ගෙන කිසිදු ගෙවීමක් කල් දැමීම හෝ පමා කිරීම නොකළ යුතුය. එමෙන්ම මෙම සංශෝධිත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කිසිදු වියදම් දැරීමක් නොකළ යුතු අතර, ඉහත සඳහන් වැය විෂයයන් සඳහා අතිරේක වියදම් දැරීම වෙනුවෙන් මුදල් රෙගුලාසි 66 හෝ 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා හෝ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා හෝ භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් නොකළ යුතුය.

1.2. මැනවින් ක්‍රියාත්මක නොවන රාජ්‍ය ආයතන සඳහා සලසා ඇති ප්‍රතිපාදන සීමා කිරීම

මැනවින් ක්‍රියාත්මක නොවන රාජ්‍ය ආයතන සතුව ඇති වත්කම් නිසි පරිදි ප්‍රයෝජන ගනිමින් ඒවායේ ආදායම ඉහළ නැංවීම සඳහා අදාල ආයතන දිරි ගන්වනු පිණිස 2007 මුද්‍රිත ඇස්තමේන්තු මගින් සලසා දී ඇති ප්‍රතිපාදන වලින් 5% ක් අදාල අයවැය යෝජනාවට අනුව අඩු කරනු ඇත.

1.3. අවදානම මත පදනම් වූ විගණනය ක්‍රියාත්මක කිරීම

පොහොර, ඖෂධ හා ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රාජ්‍ය ආයතන විසින් වියදම් දැරීමේ දී රජයට වාසි සහගත වන ලෙසත් අනවශ්‍ය ප්‍රමාදවීම් වැලකෙන ලෙසත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුවේ. එවැනි සෑම මිලදී ගැනීමක්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශේෂ විගණන ඒකකයක් මගින් විමර්ෂණයකට ලක් කිරීමට පියවර ගනු ලැබේ. මීට අදාලව සකස් කරනු ලබන ප්‍රසම්පාදන සැලසුම් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2007.01.31 දිනට පෙර එවිය යුතුවේ.

02 මුලධන වියදම් කළමනාකරණය

2.1 සංවර්ධන ප්‍රමුඛතා

සංවර්ධනය අතින් පසුගාමීව ඇති ප්‍රදේශ වල සංවර්ධන කටයුතු ඉහළ නැංවීමටත්, දිළිඳුබව නැති කරලීම අරමුණු කරගත් සංවර්ධන උපාය මාර්ග තුල විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග , විදුලිබල සැපයුම, ජල සම්පාදනය හා වාරිමාර්ග, නිවාස සංවර්ධනය සහ ජීවනෝපාය සංවර්ධනය යන ක්ෂේත්‍රයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දියයුතුවේ.

2.2. 2006 වර්ෂය තුල නිම නොකළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දේශීය අරමුදල් උපයෝගී කොට ගෙන නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර 2006 අයවැය යටතේ දැනටමත් වැඩ ආරම්භකර, එහෙත් අවසන් කර නොමැති හෝ නියමිත ඉලක්කය ලඟා කර ගැනීමට අපොහොසත් වූ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඒවා කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග, විදුලිබල සැපයුම, ජලසම්පාදන හා වාරිමාර්ග, නිවාස සංවර්ධන හා ජීවනෝපාය සංවර්ධනය වැනි ප්‍රමුඛතා අංශවලට අයත් එබඳු කාර්යයන් සඳහා 2006 වර්ෂය වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන අහෝසි වී යාමට ඉඩ නොදී 2007 වර්ෂයේ ප්‍රයෝජනයට ගැනීම සඳහා තැන්පත් ගිණුමකට මාරු කිරීමට මවිසින් නිකුත් කළ 2006.12.20 දිනැති අංක. 188(1)/2006 දරණ චක්‍රලේඛය මගින් විධිවිධාන සලසා ඇත.

2.2. 2007 වර්ෂය තුල නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(i) ප්‍රාදේශීය විෂමතාවයන් දුරලීමේ අරමුණින් තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 කෙරෙහි වැඩි ප්‍රමුඛතාවය ලබාදීම සඳහාත්,

(ii) එකම කාර්යය සඳහා වූ සංවර්ධන ව්‍යාපෘති, අමාත්‍යාංශ කිහිපයක් මගින් ඉටු කිරීම (ද්විකරණය) වැළැක්වීම සඳහා අදාල ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් සැලසුම් කෙරෙන බව තහවුරු කර ගැනීම සඳහාත්,

(iii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව හා ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලවකවානුව තුල ඉටු කිරීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් මැදිකාලීන රාමුව යටතේ 2007 වසර තුළදී නියත

වශයෙන්ම ඉටු කළ හැකි කාර්යයන් හඳුනා ගෙන ඉතිරි ප්‍රතිපාදන ඉදිරි වර්ෂවලට ගෙන යාම සඳහාත්,

(iv) අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් ඇස්තමේන්තුවල සඳහන් කළ ව්‍යාපෘති සඳහා විධිමත් අනුමැතිය ලැබෙන බව තහවුරු කිරීම සඳහාත්,

වැය ඇස්තමේන්තුවල පාද සටහන් යටතේ දැක්වෙන උපදෙස් තරයේ පිළිපදින ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වූවහොත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරීන් අමතනු මැනවි.

03. වියදම් සම්බන්ධයෙන් වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාලව ඉහතින් සඳහන් කළ උපදෙස් සැලකිල්ලට ගනිමින් එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2007 වර්ෂයේ වියදම් දැරිය හැකි සීමාවන් ඇතුලත් ප්‍රතිශෝධිත ප්‍රතිපාදන සීමාවන් දැක්වෙන ලේඛණය **ඇමුණුම්** 1 වශයෙන් දක්වා ඇත. <u>මේ අනුව එක් එක් වැය විෂය යටතේ නැවත ඇස්තමේන්තු කරන ලද සංශෝධිත ප්‍රතිපාදන සීමාවන් දැක්වෙන ලේඛණයක් 2007.01.16 දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට එවිය යුතුය.</u> භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් මුදා හරිනු ලබන්නේ මෙම සංශෝධිත ඇස්තමේන්තුව මත බව සැලකුව මැනවි.

### 04. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

4.1 මෙම චක්‍රලේඛයේ **ඇමුණුම** 2 හි දක්වා ඇති ශීර්ෂයන් වෙනුවෙන් මුද්‍රිත ඇස්තමේන්තු වල දක්වා ඇති රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සීමාවන් සංශෝධනය විය යුතුවේ.

4.2 2007 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුකූලව 2007.01.01 දින සිට දීමනා හැර මූලික වැටුප පදනම් කර ගෙන ආපදා ණය ගෙවිය යුතු වේ. එසේ ආපදා ණය ගෙවීමේ දී පහත සඳහන් උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුවේ.

(අ) කණිෂ්ඨ ශ්‍රේණිවල සේවකයන් සහ පළමු වතාවට ආපදා ණය ඉල්ලුම් කරන සේවකයින් හට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

(ආ) සේවකයකු කලින් ලබා ගත් ආපදා ණය මුදලින් 2/3 ආපසු ගෙවා ඇත්නම් පමණක් නැවත ආපදා ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(ඇ) ආපදා ණය මුදලින් 2/3 සම්පූර්ණ වීම සඳහා අදාල මුදල එකවර ආපසු ගෙවනු ලබන සේවකයින්ට ආපදා ණය මුදල නැවත ගෙවිය යුත්තේ මෙහි 4.2. (අ) සහ 4.2. (ඉ) 1 සහ 2 යටතේ ගෙවීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික වීමෙන් පසුව සහ පොරොත්තු ලේඛණයේ අනුපිළිවෙල අනුවය.

(ඇ) උපරිම වියදම් සීමාව කිසිදු ඉල්ලීමක් සඳහා ප්‍රතිශෝධනය කරනු නොලැබේ. එහෙත් අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව සාධාරණ හේතු මත සංශෝධනයන් සඳහා සලකා බලනු ලැබේ.

(ඉ) ණය අත්තිකාරම් ගෙවීමේ දී පහත සඳහන් ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කළ යුතුවේ.

1. උත්සව අත්තිකාරම්
2. විශේෂ අත්තිකාරම්
3. ආපදා ණය

### 05. වාණිජ කටයුතු අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද උපරිම වියදම් සීමාව දැඩිසේ පිළිපැදිය යුතුය. මෙම සීමා ප්‍රතිශෝධනය කිරීම පිළිබඳ ඉල්ලීම් සලකා බැලීම් කරනු ලබන්නේ විශේෂ අවස්ථාවකදී පමණි. අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාවන් පමණක් පිළිගත හැකි සාධාරණ කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ නම් පමණක් ප්‍රතිශෝධනය සඳහා සලකා බලනු ලැබේ.

### 06. අතිරේක ප්‍රතිපාදන

වෙනත් රාජ්‍ය ආයතන සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කරදීමට 2007 අයවැය ඇස්තමේන්තු මගින් භාණ්ඩාගාරය වෙත ප්‍රතිපාදන සලසා ඇත්තේ අතිගරුජනාධිපති තුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා පමණි. ඉන් පරිබාහිර කරුණක් සඳහා අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් ඉල්ලුම් කරනු ලබන්නේ නම්, එසේ කල යුත්තේ අදාල අමාත්‍යාංශය විසින් පරිපූරක ඇස්තමේන්තුවක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් පසුවය.

### 07. ප්‍රතිපාදන මාරු කිරීම

මුදල් රෙගුලාසි 66-69 අනුව ප්‍රතිපාදන මාරු කිරීම සඳහා භාණ්ඩාගාරය වෙත කරනු ලබන ඉල්ලීම් සලකා බලනුයේ එම ඉල්ලීම් ඉහත සඳහන් උපදෙස් වලට පටහැනි නොවන අවස්ථාවන්හිදී පමණි.

### 08. වියදම් දැරීම සඳහා අධිකාරී බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2006 දෙසැම්බර් 06 වැනි දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලද 2006 අංක 47 දරණ විසර්ජන පනත අනුව 2007 වසර තුල දී වියදම් දැරීම සඳහා අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

ගෙවීම් වව්චර්පත් සහ වෙනත් ලියකියවිලි මත බලාධිකාරිය පහත පරිදි සටහන් කළ යුතුය.

අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2007 අංක 01 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය.

ආ) විශේෂ නිති සේවා කටයුතු සඳහා 2007 අංක 01 දරණ විශේෂ නීති සේවා අධිකාරිය.

ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 2007 අංක 01 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය.

### 09. පොදු කරුණු

9.1. වඩාත් ඵලදායි වියදම් වර්ගිකරණයක් කිරීම සඳහා 2006 වර්ෂයේ පැවති සියළු අයවැය වියදම් වැඩසටහන්, මෙහෙයුම් වැඩ සටහන සහ සංවර්ධන වැඩ සටහන යනුවෙන් වැඩ සටහන් දෙකක් යටතට පත් කර ඇති අතර, වැය විෂය අංක හා වැය විෂය නාමයන්ද 2007 අයවැය ඇස්තමේන්තු මගින් සංශෝධනය කර ඇත. මීට අදාල විස්තර **ඇමුණුම් 3** හි දක්වා ඇත.

9.2 රජයේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඉටු කර ගැනීමේ හැකියාව මූලික වශයෙන්ම රඳා පවතින්නේ දැඩි මූල්‍ය විනයක් අනුව වියදම් දැරීම තුළිනි. එබැවින් මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් තරයේ පිළිපැදීම, සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ ප්‍රමුඛ වගකීමක් ලෙස සලකා කටයුතු කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි.

9.3 ඉහත සඳහන් කරුණු පිළිබඳ අවශ්‍ය පැහැදිලි කර ගැනීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් වෙතින් ලබා ගත හැකිවේ.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :- 1.විගණකාධිපති.

2007 à×<`× à`&¦õµÈù¦õ¦ ´ è¦ù¦ û¦õ¦û$÷¦ù &Ù&$ à`õ¦ à´$õ]$'Á, µ÷¦û$Ì õµÈù¦õ¦ &{ Ø$í] à$×õ ù×ù¦ &ú¦{$ <¦ &'µÁ$½õ û¦õ¦û$÷¦ù×ù¦ û{õ à$æ#õ¦× àù¦<
à´$õ]$'Á ´>õÆù¦ &æ&¦ æØù Ù÷¦ µÙ¦çù×ù¦ µ<ù¦ µ<ù¦< Ùý$ µ÷¦ù¦ à`õ.

Ø`. "000

û¦õ¦µÁ$½õ à`&¦õµÈù¦õ¦< - 2007

| | | | û¦ùØ$<Ìöù | | | | ´Ùøù | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| à´$õ]'Á Á¦ÌÂ à'æ× | µ÷¦û$Ì õµÈù¦õ¦ Á¦ÌÂ à'æ× | Á¦ÌÂ× /à$×õù ù´ | à`&¦õµÈù¦õ¦< 2007 | 2% û¦õ¦û$÷¦ù àò¦æ¦ÍÈ | ´`ùÑù¦ æ¦×$õ¦´æ µù$<ù Ø$í] <]$û$Ø û¦õ¦û$÷¦ù àò¦æ¦Í´ 5% | û¦õ¦µÁ$½õ à`&¦õµÈù¦õ¦< 2007 | à`&¦õµÈù¦õ¦< 2007 | ÷¦ÑæØó× {$ ã[ó Ñ×÷¦È ÷¦`Í´ ×ðµõ¦ {÷¸ó$èõ¦ û¦õ¦û$÷¦ù áõ¦ÍÒÈ | û¦õ¦µÁ$½õ à`&¦õµÈù¦õ¦< 2007 |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

( µ´´ &'µÁ$½õ û¦õ¦û$÷¦ù àù¦< è`ÙûÈ æØù Ù÷¦ &'µÁ$½õ à×<`× à`&¦õµÈù¦õ¦ µÙ¦çù 2007.01.16 ÷¦ù µ{$ âð û¦ö´ í$õ¦æ à×<`× µ÷¦û$Ì õµÈù¦õ¦< µ<õ á÷¦Íûõ¦ æÙ ×¦õ¦µÓ.)

ඇමුණුම 2

## රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල සංශෝධනයන්

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | විෂය අංකය | I<br>රජයේ කටයුතු | II<br>රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව<br>රු. | III<br>රජයේ කටයුතු පිළිබඳ ගිණුම් වලට බැර කළ යුතු ලැබීම් වල අවම සීමාව<br>රු. | IV<br>රජයේ කටයුතු වල හර ශේෂයන්ගේ උපරිම සීමාව<br>රු. |
|---|---|---|---|---|---|---|
| 32 | සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා | 11101 | රජයේනිලධාරීන්ට අත්තිකාරම් | 73,50,00,000 | 53,59,20,000 | 260,00,00,000 |
| 47 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 107,00,00,000 | 51,60,00,000 | 270,00,00,000 |
| 107 | ශ්‍රී ලංකා යුද හමුදාව | 22201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 173,00,00,000 | 92,17,20,000 | 367,50,00,000 |
| 108 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 54,00,00,000 | 20,89,20,000 | 117,50,00,000 |
| 110 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 53,00,00,000 | 23,55,60,000 | 117,50,00,000 |
| 111 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 122,50,00,000 | 69,81,60,000 | 315,00,00,000 |
| 197 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 41,90,00,000 | 31,63,20,000 | 176,50,00,000 |
| 200 | තැපැල් දෙපාර්තමේන්තුව | 36001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 51,40,00,000 | 24,15,00,000 | 163,50,00,000 |

ඇමුණුම 3

## සම්මත වැය විෂයයන්, වැය විෂයය කාණ්ඩ සහ වැය විෂයය නාමයන්

| වැය විෂය | කාණ්ඩය / වැය විෂය නාමය | ඒ ඒ. වැය විෂය අයිතමය සඳහා ඇතුළත් විය යුතු වියදම් (කලින් භාවිතා කළ වර්ගී කරණයේ වෙනසක් සිදු නොවන ස්ථානයන්හිදී ඒ බව සඳහන් කර ඇත.) |
|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | |
| | **පුද්ගල පඩිනඩි** | |
| 1001 | වැටුප් හා වේතන | වෙනසක් නොවේ |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | අතිකාල දීමනා. වෙනත් දීමනා. නිවාඩු දීමනා. නිවාඩු දුම්රිය බලපත්‍ර. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ වෙනත් සියලු ආකාරයේ දීමනා සහ ගෙවීම් |
| | **ගමන් වියදම්** | |
| 1101 | දේශීය | වෙනසක් නොවේ |
| 1102 | විදේශීය | වෙනසක් නොවේ |
| | **සැපයීම්** | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | ලිපිද්‍රව්‍ය. යාන්ත්‍රික හා විදුලි උපකරණ යනාදි කාර්යාලීය අවශ්‍යතා සහ එවැනි සියලු ආකාරයේ වියදම් |
| 1202 | ඉන්ධන | ඉන්ධන හා ලිහිසි තෙල් |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | ආහාර පාන සැපයීම් සහ නිල ඇඳුම් සැපයීම මත වන වියදම් |
| 1204 | වෛද්‍ය සැපයීම් | වෙනසක් නොවේ |
| 1205 | වෙනත් | ඉහත අයිතමයන් යටතේ වර්ග කළ නොහැකි විශේෂ ආකාරයේ සැපයීම් මත වන වියදම් |
| | **නඩත්තු වියදම්** | |
| 1301 | වාහන | වෙනසක් නොවේ |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | වෙනසක් නොවේ |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම්. | ගොඩනැගිලි හා ඉදිකිරීම් වල නඩත්තු වියදම් |
| | **සේවා** | |
| 1401 | ප්‍රවාහන | වාහන කුලී ගාස්තු හා ප්‍රවාහනය සඳහා අදාළ වන වියදම් |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | තැපැල් ගාස්තු හා විදුලි සංදේශ සේවා මත වියදම් |
| 1403 | විදුලිය හා ජලය | වෙනසක් නොවේ |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | බදු කුලී. පළාත් පාලන ආයතන වලට ගෙවනු ලබන වරිපනම් හා බදු යනාදිය |
| 1405 | වෙනත් | ඉහත අයිතමයන් යටතේ වර්ග කළ නොහැකි විශේෂ ආකාරයේ සේවා ලබාගැනීම වෙනුවෙන් වන වියදම් |
| 1406 | අනපේක්ෂිත සේවා | අනපේක්ෂිත පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදන. (ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු සඳහා පමණි.) |
| | **මාරු කිරීම්** | |
| 1501 | සුබ සාධන වැඩ සටහන් | සුභසාධන වැඩ සටහන් මගින් ගෘහයන්ට. රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයින් වෙත කෙරෙන ප්‍රදානයන් සහ මාරු කිරීම් |
| 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | විශ්‍රාම් අරමුදලට දායකත්වය. රාජ්‍ය සේව අර්ථසාධක අරමුදලට දායකත්වය. විශ්‍රාම වැටුප්. විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික යනදි විශ්‍රාමික ප්‍රතිලාභ |
| 1503 | රාජ්‍ය ආයතන | රාජ්‍ය ව්‍යාපාර. රාජ්‍ය මූල්‍ය ආයතන වලට සහ අනෙකුත් රාජ්‍ය ආයතන වලට කරන මාරුකිරීම් සහ ප්‍රදානයන්. රාජ්‍ය ව්‍යාපාර වල මෙහෙයුම් පාඩු යනාදිය |
| 1504 | සංවර්ධන සහනාධාර | මිල සහනාධාර. පොළී සහනාධාර යනාදි සියලු සංවර්ධන සහනාධාර මත වන වියදම් |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | දේශීය සහ විදේශීය සංවිධාන සඳහා සම්මාදම් දායක මුදල් සහ සාමාජික ගාස්තු |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | වෙනසක් නොවේ. කලින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය යටතේ ඇතුළත් කර තිබුණි |
| 1507 | පළාත් සභා | පළාත් සභා සඳහා වන ප්‍රදානයන්. (පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සඳහා පමණි) |
| 1508 | වෙනත් | ඉහත අයිතමයන් යටතේ වර්ග කළ නොහැකි වෙනත් සහනාධාර ප්‍රදානයන් මාරුකිරීම් හානි රක්ෂණ සහ පාඩු සහ කපා හැරීම් යනාදි වියදම් |
| | **පොලී ගෙවීම්** | |
| 1601 | දේශීය ණය | වෙනසක් නොවේ |
| 1602 | විදේශීය ණය | වෙනසක් නොවේ |
| | **මූලධන වියදම්** | |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම්. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් මත වන පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීමේ වියදම් |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | වෙනසක් නොවේ |
| 2003 | වාහන | වෙනසක් නොවේ |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | |
| 2101 | වාහන | වෙනසක් නොවේ |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | වෙනසක් නොවේ |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | වෙනසක් නොවේ |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම්. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් අත්පත් කරගැනීමේ වියදම් |
| 2105 | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | වෙනසක් නොවේ |
| | **ප්‍රාග්ධන මාරු කිරීම්** | |
| 2201 | රාජ්‍ය ආයතන | රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ආයතන වලට කරන මාරුකිරීම් සහ ප්‍රදානයන් |
| 2202 | සංවර්ධන සහායන් | සංවර්ධන ආධාර.රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින්ට ප්‍රාග්ධන ප්‍රදානයන් යනාදිය |
| 2203 | පළාත් සභා | වෙනසක් නොවේ. (පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සඳහා පමණි) |
| 2204 | විදේශයන්ට මාරු කිරීම් | වෙනසක් නොවේ |
| | **මූල්‍යවත්කම් අත්පත් කර ගැනීම** | |
| 2301 | හිමිකම් දායක මුදල් | වෙනසක් නොවේ. රජයේ හිමිකම් කොටස් ප්‍රාග්ධන දායක මුදල් |
| 2302 | ණයදීම | ණය දීම සහ ණය පිරිවැය යටතේ වන වියදම් |
| | **හැකියා වර්ධනය** | |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | පුද්ගල පුහුණුව. හැකියාවන් සහ නිපුනතා වර්ධනය. ආයතනික ධාරිතා වර්ධනය වෙනුවෙන් දේශීය හෝ විදේශීය අරමුදල් මගින් දරණු ලබන සියළු වියදම් |
| | **වෙනත් මූලධන වියදම්** | |
| 2501 | ප්‍රතිව්‍යුහගතකරණය | ප්‍රතිව්‍යුහගතකරණය සහ ප්‍රතිසංස්කරණය සඳහා වන වියදම් |
| 2502 | වෙනත් ආයෝජන | සියලු සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා වන ප්‍රතිපාදන ඒ ඒ ව්‍යාපෘතියේ නිමැවුම්/ප්‍රතිඵලය හෝ ප්‍රතිලාභ වල ස්වරූපය අනුව එයට වඩාත් ගැලපෙන මූලධන වැය විෂය යටතේ වර්ග කළ යුතුවේ. එසේ කළ නොහැකි විශේෂ ව්‍යාපෘති හෝ වියදම් සඳහා පමණක් මෙම වැය විෂය නාමය භාවිතා කළ යුතුය |
| 2503 | අනපේක්ෂිත සේවා | අනපේක්ෂිත මූලධන වියදම් සඳහා වන ප්‍රතිපාදන.( ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු සඳහා පමණි.) |
| | **රාජ්‍ය ණය ආපසු ගෙවීම්** | |
| | **රාජ්‍ය ණය ආපසු ගෙවීම්** | |
| 3001 | දේශීය | දේශීය ණය සහ වෙනත් ආපසු ගෙවීම් |
| 3002 | විදේශීය | වෙනසක් නොවේ |